# සීගිරි ගී තුළින් හෙළිවන ප්‍රකාශිත සමාජීය, ආර්ථික, දේශපාලනික තොරතුරු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බටාඳුරේ නන්ද හිමි[1]

ප්‍රමුඛ පද : සීගිරි ගී, සමාජීය, ආර්ථික, දේශපාලනික

## හැඳින්වීම

සිංහල ප්‍රෞඪ රාජධානි යුග තුළ බිහි වූ සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස සීගිරිය පෙන්වා දිය හැකිය. කාශ්‍යප රජුගේ කලා නිර්මාණ රසක් පෞරාණිකත්වය ප්‍රකට කරනු ලබන ස්ථානයකි. මෙම ස්ථානය නැරඹීමට 8-10 සියවස්වල පැමිණි සංචාරකයන් වැදගත් වටිනාකමක් එක් කළේය. සීගිරි බිත්තියෙහි නිර්මිත සිතුවම් හා ඒ තුළ කලාත්මක නිර්මාණය දෙස බලා ඇති වූ තම සිතැඟි අදහස කැටපත් පවුරෙහි සටහන් කර ඇත. පරණවිතාන මහතා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රාථමික මූලාශ්‍රයෙහි ගී 685ක් ලෙස සඳහන් කර ඇති අතර ඒ තුළින් වඩාත් එකල සමාජීය තොරතුරු සපයනු ලබයි. ඒ අනුව සීගිරි කවිය තුළින් හෙළිවන එකල සමාජීය කාරණා අධ්‍යයනය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව සීගිරියේ කැටපත් පවුරේ නිර්මිත ගී තුළින් හෙළිවන අතීත සමාජ වාතාවරණය කුමක්ද? යන්න බැලීමේ දී සීගිරියේ කැටපත් පවුරේ නිර්මානකරණයේ යෙදුණු කවීන් හඳුනාගැනීම, කවි විශ්ලේෂණය කිරීම හා ඒ හරහා එකල සමාජීය දේශපාලනික, ආර්ථික, සමාජීය හොඳ නරක යන කාරණා පිළිබඳව විග්‍රහයක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි.

## ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් වන මෙම අධ්‍යයනය විමර්ශනාත්මක ක්‍රමවේදය මත සිදු කෙරේ. ද්විතීයික මූලාශයන් පදනම් කරගන්නා අතර ඒ සඳහා ශාස්ත්‍රීය පර්යේෂණ, ශාස්ත්‍රීය පත්‍රිකා, පුවත්පත් ලිපි හා අන්තර්ජාල මූලාශයන් යොදා ගැනේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ක්‍රි.ව.7- 8- 9 යන සියවස් තුළ සිංහල සාහිත්‍යයෙහි බිහි වූ අග්‍රගණ්‍ය නිර්මාණයක් ලෙස සීගිරි ගී පෙන්වා දිය හැකිය. සීගිරි කුරුටු ගී 685ක් ප්‍රාථමික මූලාශ්‍රය සංග්‍රහ කර ඇති බව දැකගත හැකි අතර ඒ තුළින් එකල සමාජ හා පුද්ගලානුබද්ධ කාරණා හෙළිවන අයුරු පෙන්වා දීම මෙම අධ්‍යයනයට උපයුක්ත කරගනු ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ සීගිරි කැටපත් පවුරේ සටහන් වූ ගී පද්‍ය තුළින් හෙළිවන එකල සමාජ පසුබිම හා පුද්ගලානුබද්ධ කාරණා හෙළිවන

[1] සිංහල අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
batandurenandahimi@gmail.com

කවි හඳුනාගැනීමත් ඒ තුළින් අතීත රැකියා පිළිබඳව, සංස්කෘතික හා දේශපාලන තත්වයන් හා සමාජ ආකල්පයන් පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කිරීමත්ය. ගුණාත්මක පර්යේෂණයක් වන මෙම අධ්‍යයනය විමර්ශණාත්මක ක්‍රමවේදය මත සිදු කෙරේ.

ද්විතීයික මූලාශ්‍රය පදනම් කරගන්නා අතර ප්‍රධාන අනාවරණ වශයෙන් සමාජ කාරණා හෙළි කරන පද්‍ය බොහෝ ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. ඒ අනුව එකල පැවති සමාජ කාරණා අතර පවුල් පසුබිම, බහු භාර්යා විවාහ ක්‍රමය, ගණිකා වෘත්තිය හා එම කාන්තාවන්ගේ ජීවන ස්වරූපය, කාන්තාවනට පැවති සමාජ තත්ත්වයන්, සීගිරි සමාජය පැවති ආකාරය පිළිබඳව කරුණු මනාව අවධාරණය කරගත හැකිය. එසේම එකල සැමියෙකු මිය ගිය පසු එවැනි වැන්දඹු කාන්තාව ජීවත් වූයේ ඉතා සරල ක්‍රමවේදයක් යටතේ බව මාසිකව ඔසප් වන කාලය තුළ දී ස්වාමියාට නිදන යහන දී තමන් බිම සයනයෙහි යෙදුණු ක්‍රමවේදයක් එකල පැවති බවට සීගිරි කවිය සාක්ෂි සපයයි. ඉන්දීය සමාජයේ බ්‍රාහ්මණ යුගයේ කාන්තාවට හිමි වී තිබූ තත්ත්වය අතීත ලක්දිව ද අඩු වැඩි වශයෙන් පැවති බවත් සීගිරි කවිය කරුණු මතු කරයි. එසේම භාෂාත්මක ලක්ෂණ තුළින් ප්‍රචලිතව පවතින කාරණා ඔස්සේ යොදාගත් උපමාලංකාර හා ජන වහරෙහි පැවති සමාජමය කාරණා හෙළි කරන ප්‍රස්ථාව පිරුළු ද දැකගත හැකිය. එසේම එකල පුද්ගල සමාජයෙහි තිබූ කුලමානය හා ඔවුන් සතුවූ වංශවත් බව යන කාරණා ද කවි පද්‍ය තුළින් හෙළි වේ. එකල ජනයා අතර වූ එවැනි නාමයන් කිහිපයක් ද සීගිරි පද්‍ය තුළින් තහවුරු විය. එසේම චීන රටේ පට පිළියෙන් සැරසී ආ ගැහැණිය හා දඹදිව සිට පැමිණි අයෙකු සමඟ ළඳක අතර ඇතිවන සංවාදයත් කාලිදාසගේ මේඝ දූතය පිළිබඳව සඳහන් කිරීම තුළින් අතීත ලාංකේය සමාජය විදේශීය රටවල් සමඟ සබඳතා පැවති බවට සාදක සපයනු ලබයි. අධ්‍යාපනික වශයෙන් එකල පැවති රනහල, තරල්පා, කබල්නාපාන්, වැනි පිරිවෙන් කිහිපයක් පිළිබඳ ව තහවුරු වේ.

ආර්ථික තොරතුරු අනුව ප්‍රධාන වශයෙන් අතීත රට තුළ ගොඩ සහ මඩ යනුවෙන් ගොවිතැන බෙදී තිබූ අතර කොමඩු, කැකිරි, වැටකොළු වැනි දේ එකල වගා කරන්නට ඇත. තත්කාලීන දේශපාලනික තොරතුරු වශයෙන් එකල රජවරුන් කිහිප දෙනෙක් පිළිබඳ තොරතුරු වාර්තා වන අතර නිලධාරීන් සහ අමාත්‍ය මණ්ඩලයත්, රාජ්‍ය නිල නාමයන් ද ඒ අතර වේ. එකල විනෝද චාරිකා යෑමේ සම්ප්‍රදායක් පැවති බවට සීගිරි කවිය තහවුරු කරයි. කවි ලියූ බොහෝදෙනා තම නම, වංශය පමණක් ම නොව තමන් ශ්‍රමණ ද? ගිහි ද? යන වග සහ තමන්ගේ සමාජ මට්ටම පිළිබඳව ද කරුණු සටහන් කිරීම තුළින් අතීත පුද්ගලයන් පිළිබඳව තොරතුරු හෙළි වේ. එසේම සංචාරයක පුරයක් ලෙස එකල සීගිරිය පැවති බවට කවිය සාධක සපයයි. අතීත සමාජ, දේශපාලන, ආර්ථික, අධ්‍යාපනික, පුද්ගල කාරණා මතු කරන්නක් ලෙස සීගිරි කවිය ඒ අනුව දැකගත හැකිය. ප්‍රධාන වශයෙන් අතීත මානව සුවිශේෂ නිර්මාණයක් වූ සීගිරිය තුළ තිබූ කැටපත් පවුර පුද්ගල සමරු සටහන් සඳහන් කළ අතීත පුරාවෘතයක් වන අතර ඒ තුළින් විශද වන අතීත කාරණා හා පුරාවිද්‍යාත්මක වශයෙන් අතීත ලාංකේය

සමාජය චිත්‍රණය කිරීම සඳහා ලංකේය අධ්‍යාපනික, දේශපාලනික, සමාජමය පමණක් නොව ආර්ථික, සංස්කෘතික, වෘත්තීන් හා පුද්ගලයන්ගේ සමාජ තත්ත්වයන් පිළිබිඹු කරනු ලබන මනා නිමවුමක් බව සුපැහැදිලි වේ.

## සමාලෝචනය

සිංහල සාහිත්‍ය වංශකතාව තුළ බිහි වූ සුවිශේෂතම සාහිත්‍යමය අංගය නොහොත් ප්‍රෞඪ ඉතිහාසයක සාහිත්‍යමය අගය ඉස්මතු කරලන සාහිත්‍ය නිර්මාණය ලෙස සීගිරි පද්‍ය පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එහි පැමිණි නොයෙක් සංචාරකයන් තම සිතැඟි පරිදි සමරු සටහන් ලෙසින් ලියා තැබූ සීගිරි කවි තුළින් බහුතරයක් කාව්‍යයන් අතීත සමාජීය කාරණා සහ තොරතුරු රාශියක් හෙළි කරනු ලබයි. බොහෝ කවීන්ගේ නිර්මාණ තුළින් සීගිරි ලලනාවන්ගේ රූ සපුව පමණක් නොව එයින් ඔබ්බට ගිය අතීත සමාජයක තොරතුරු රැසක් දායාද කළ බව මනාව මෙතෙක් කරුණු තුළින් හෙළි කරන්නට විය. ඒ අතර අතීත ලංකාව සහ විදේශ රටවල් සමඟ තිබූ සබඳතාව, අධ්‍යාපනික වටපිටාව සහ දේශපාලනික වශයෙන් තිබූ නිලතල සහ කාරණා සේම සමාජ පුද්ගල තොරතුරු හා ජීවන ආර්ථික වටපිටාව පිළිබඳව තොරතුරු මනාව මතු කරවන අතර විශේෂයෙන් ම කාන්තාවන්ට එකල සමාජය තුළ හිමි වූ ස්ථානය පිළිබඳව ද සීගිරි කවිය කරුණු හෙළි කර ඇත. මේ ආදී වශයෙන් අතීත සමාජ පුද්ගල විශාල තොරතුරු රැසක් හෙළි කිරීමට සමත් වූ සාහිත්‍යාංගයක් ලෙස සීගිරි කවිය පෙන්වා දිය හැකිය. ඒ අනුව සීගිරි කවිය යනු අතීතය තත්ත්වය වත්මන් සිත් තුළ පිළිබිඹු කරනු ලබන පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාධකයක් ලෙස මනාව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍රය

ජයතිලක, කේ. (1996). ***සීගිරි ගී නිර්මාණ.*** ප්‍රදීපා ප්‍රකාශකයෝ කොළඹ.

මුදියන්සේ, ගනන්ද. (2004). ***සීගිරි පද්‍යාවලිය***. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

විතාන, ගුණසේන. (1992). ***සීගිරි ගීයේ සමාජ දැක්ම.*** ලස්සන මුද්‍රණ ශිල්පියෝ.